මක්සිම් ගෝර්කි ගේ මහා නවකතාව

සුමිත් පෙරේරා ගේ සිතුවමින්

පළමුවන පරිච්ඡේදය - තුන්වන කොටස

”මයිකල් වැල්සොව්” හෙවත් පාපතර මිනිසා.

මෙවැනිම පිවිතයක් ගෙවූ තවත් එක් පුද්ගලයෙකු මේ ගම්මානයේ වාසය කළේය. ඔහු "මයිකල් වැල්සොව්" නම් රළු පෙනුමකින් යුත් පුද්ගලයාය.

එහෙත් මයිකල් තරමකට හෝ අනිත් ගම්මුන්ගේ වෙනස් වූ ලක්ෂණ පෙන්නුම් කළේය. මයිකල් ට තිබුනේ ඉතා කුඩා එහෙත් තියුණු ඇස් දෙකකි. ඒවා ඔහුගේ ගතකම ඇතිබැමට යටින් මතුවී අනෙක් පුද්ගලයින් දෙස සැකයෙන් බලන්නට හුරු වී තිබුණි. මයිකල් බොහෝවිට අනිකුත් අය දෙස බැලුවේ සැකය සහ අවිස්වාශය මුසුවූ සිනහවක්ද සමගය.

කම්හලේ හිටපු හොඳම , දක්ෂම කම්මල් බාස් ඔහුය. එපමණක් නොව ගමේ සිටි ශක්තිමත්ම මිනිසාද ඔහු විය. ඔහු සමග ගැටෙන්නට තබා හැරෙන්නටවත් තරම් භය්යක් අනිත් ගම්වැසි පිරිමින්ට නොතිබිණි.

කම්හලේ ෆෝර්මන් සහ සුපින්ටෙන්ඩන් යන දෙදෙනාම අනිකුත් කම්කරුවන් බියෙන් තැති ගන්වන්නට සමත් වුහ. එහෙත් මයිකල් මේ දෙදෙනාව තඹයකට වත් මායිම් නොකළේය. ඒ නිසාම ඔහුට වැඩ ලැබුනේ අඩුවෙනි.. ලොක්කන්ගෙන් හොඳ නමක් දිනා ගැනීමට අපොහසත්වූ ඔහුගේ ආදායමද සැලකිය කිය යුතු ලෙස අඩු වුවේය.

ශක්තිමත් මිනිසෙකු වූ මයිකල් ඒ ශක්තිය හොඳ දෙයකට යොදා ගත්තේ නැත. කුකුල් කේන්ති කාරයෙකු වූ ඔහු දිනපතාම කම්හලේ හෝ ගමේ කාට හෝ පහර දුන්නේය.

එහෙයින් ගම වැසි හැමෝම ඔහුට බියවුවා සේම කිසිවෙක් ඔහුට ඇලුම් නොකළහ. ගම්මු හැමෝම වාගේ ඔහුගෙන් තරහා පිරිමහ ගන්නට මාන බලමින් සිටියෝය.ඔහුට ප්‍රති ප්‍රරිහාර එල්ල කරන්නට ගැම්යෝ බොහෝ වර උත්සාහ කළඳ ඒ එකක්වත් සාර්ථක වූයේ නැත.

මයිකල්ට කවුරුන්හෝ තර්ජනය කල මොහොතක ඔහු ක්‍රියා කළේ මෙලෙසය. මුලින්ම ගල්ගෙඩියක් හෝ පොලු කෑල්ලක් එසේ නැත්නම් යකඩයක් සුරතේ රැඳුනි, අනතුරුව සිය දෙපා පුළුල් ලෙස දෙපසට විහිදුවමින් නියම ගණාන් කාරයෙකු මෙන් සිට ගැනුනි. දැන් මයිකල් තම සතුරා එන තෙක් හොර ගල් අහුලමින් බලා සිටින අවස්ථාවයි.

ගම්වාසීන් ඔහුගේ ඇස් වලින් පටන් ගෙන බෙල්ල දක්වා වැවී තිබුණ ගැන රැවුලට බිය වුහ. එසේම ඔහුගේ අත් ගොබ පුරා ඝනව වැඩි තිබු මව්ල් දැකීම ගම්මුන්ගේ හිතිය තිවූ කිරීමට තවත් හේතුවකි.

මිනිස්සු වඩාත්ම බිය වූයේ ඔහුගේ තියුණු නෙත් යුගල දැකීමටයි. ඒවා ඉතා කුඩා මෙන්ම තියුණු ලෙස ඔවුන් දෙස එල්ල වී තිබු ඒවා විය. ඒවායින් විහිදුනු කිරණ මිනිසුන්ගේ සිරුරු පසාරු කරමින් ගමන් කල වාගේ කඳම්බ මෙන් විය.

එම ඇස් වල ඉලක්කයට යොමුවූ මිනිසුන්ට දැනුනේ ඔවුන් කිසියම් භයානක කුළු මිමෙකුගේ ඇස ගැටුනා වැනි හැඟීමකි.

ඒ කුළු මීමා යකකුට වත් භය නැති එකෙකි. ඔහු අධික බාහු බලයකින් යුක්තවුවා පමණක් නොව ඕනෑම අවස්ථාවකදී අනුකම්පා විරහිතව පහර දෙන්නටද සූදානමින් සිටියේය. ඒ බොහෝවිට තැනක නොතැනක් , හොඳක් නරකක් බැලිමකින් තොරවය.

"තොලොංවි වෙලා පලයන් .. මල පෙරේතයා.." ඔහු රළු හඬින් බැන වදියි. ඔහුගේ කහ පැහැ ගැන්වුණු දත් කළු රැවුල් ගසින් වැසුණු මුහුණ මැදින් මතුවෙයි. ඒ මහා ගැහ කැළෑවක් මැදින් මතුවුණු ගල් වැටියක් සිහි ගන්වමිනි. මිනිසුන් ඔහුට කුණු හරුපයෙන් බණිමින් එතැනින් ඉවත් වී යනු පෙනේ.

"මළ පෙරේතයා...!" ඔහු නැවතත් ඔවුන්ට බැන වදියි. බකමුනෙකු ගේ මෙන් තියුණු ඇස් ද වියරු සිනාවක්ද ඒ මුහුණේ පෙනෙන්නට තිබේ.

ඔහු තමා වැනිම තවත් මිනිසෙක් වෙත තර්ජන ගර්ජන කරමින් සටනට අභියෝග කරනා ඉරියව්වක තම හිසත් ශරීරයත් තබා ගෙන සිටියි. ඝන දුම්වලා රවුම් රවුම් පිට කරනා පයිප්ප සුරුට්ටුව දත් වලින් තදින් හපා ගෙනය.

"මොනවද උඹ කිව්වේ? "පියා පාවෙල්ගෙන් ප්‍රශ්න කළේය. තම පුතුගේ උස් කෙසඟ ශරීරයට උඩින් සෙවනැල්ලක් මෙන් නැමෙමින් මයිකල් බලා සිටියේ පාවෙල් කියන්නේ කුමක්ද යන්නයි.

"ඉවසුවා ඇති"

"මින් මතතේ මට හරි අමිමට හරි අතක් තියලා තිබුනොත් බලාගෙනයි"

පාවෙල් තම පියාට පැවසුවේ තම ඇස් මොරගෙඩි දෙකක් මෙන් ලොකු කර ගනිමිනි.



මේ අතර ඔහු කුළු ගෙඩිය එහාට මෙහාට වැනුවේ මයිකල් භය කරන්නද නොසේනම් ඇත්තටම ඔහුගේ හිස කුඩු කරන්නට දැයි දන්නේ පාවෙල්ම පමණි.

තරමක් පසු බෑ පියා තම අත්දෙක පසු පසට බැඳගත්තේ පාවෙල් දෙස කෙලින්ම නොබලමිනි. මඳ සිනහවක් කට කොනකට නගාගත් ඔහු පාවෙල් දෙසට හැරුණේය.

"හරි හරි... ඒකත් එහෙමයි කියමුකෝ "....
අනතුරුව දිග හුස්මක් ඉහලට ගත් මයිකල් තම කතාවට සුපුරුදු වචන කීපයක් ඇමුණුවේය.
"අනේ පල මල පෙරේතයා.."

දිගු නිහැඩියාවකට පසු තම බිරිඳ දෙසට හැරුණු මයිකල් :
"මගෙන් තවත් පාන් ගේන්න , ඉස්කෝලෙට දෙන්න, සිරිටු දාන්න කිය කියා සල්ලි ඉල්ලන්න එපා."

"පාශා ඔක්කොම කරයි "
"ඔයා හැම සතේම බීල බීලා ඉවර කරයි ?
"බීලා හුජ්ජ කරාම ඔක්කොම හරිනේ..? "අයය පෙරළා ප්‍රශ්න කළාය.

"උඹට වැඩක් නෑ මගේ වැඩ වලින් "මෝඩ එළදෙන.."

"උඹයි උඹේ මහලොකු පුතන්ඩියයි හම්බ කරන් කන හැටි බලමුකෝ..?"

එදා සිට ඔහුගේ මරණය තෙක්ම , පුරා වසර තුනක් මයිකල් තම පුතුට කතා කළේවත් ඔහු දෙස බැලුවේ වත් නැත.

දුප්පතාගේ හිතවතා

මයිකල්ට ඔහු වැනිම දැවැන්ත වූත් අපිරිසිදු වූත් බල්ලෙකු සිටියේය. ඇය ඔහුත් සමග සෑම උදෑසනකම පැක්ටරිය දක්වා ගමන් කලාය. ඔහුගේ හොඳම හිතවතා වූ මේ බැල්ල වැඩ හැරි ඔහු කම්හලෙන් එලියට එන තෙක් ගේට්ටුව ලඟට වී බලා සිටියාය.

නිවාඩු දිනවලදී මයිකල් තම පුරුද්දක් ලෙස ගමේ තැබෑරුමට යාමට අමතා නොකළේය. කිසි හැලහොල්මනක් නැතිව තබරුම දෙසට ගමන් කරන මයිකල්.. හිටි හැටියේම අනෙක් මිනිසුන් දෙස ඔරවා බලයි. ඒ හරියට කවුරු හරි හොයමින් යන අයෙක් මෙනි.

ඔහුගේ බල්ලාද මුළු දවස පුරාම ඔහු පස්සේ වැටී හති දමමින් ඇවිදියි.

දවස පුරාම ගම් මැද්දේ කරක් ගසා මයිකල් නිවසට එන්නේ කණාමදයා මෙන් බී ගත්තු ගමන්ය. වෙරිමතේ පසුවෙන මයිකල් රාත්‍රි ආහාරය ගන්නේ තම අතිජාත මිත්‍රයා වූ මේ බල්ලා සමගය.

වෙනෙකක් තබා ඔහු තමා කන පිඟානෙන්ම බල්ලාට කන්නට දෙන්නේ කිසිදු හිරිකිතක් නොමැතිවයි.

ඔහු කිසිම දවසක සිය බල්ලාට ගැහුවේ නැත. එසේම කෙදිනකවත් ඌට සැර වැර කළේද නැත.

එමෙන්ම මයිකල් තම බල්ලා ආදරයෙන් සුරතල් කරන අවස්ථාවක්ද කිසි දවසක උදා වූයේ නැත.

රෑ කෑමෙන් පසු මයිකල් වැඩ අරඹන්නේ කෑම කාපු තැන සිටම පියාඹන පිරිසි සංදර්ශනයක් පැවැත්වීමෙනි.

ඒ තම සදාදර බිරිඳ ඔහු කාපු බීපු තැන අස් කරන්නට මොහොතක් හෝ ප්‍රරිමාද වූ අවස්ථා වලදීය.

දැන් නැවතත් ඔහු තමාගේ ප්‍රරියතම පානය තමා ඉදිරියෙන් තබා ගනියි.

බංකුවත් පද්දා පස්සට කර බිත්තියට හෙත්තු වන මයිකල් තම කබල් ගොරෝසු කටහඬ අවදි කරයි..

"සොඳුරිය....අ...අ.. අ.. "
"සොඳුරියේ නෙවෙයි.. යෝදියේ .හික් .. හික්.. "
"ආලය කොතරම් මිහිරිද.. අ. අ. අ. .? "

ඔහුගේ දෑස් අඩවන්ය. එහෙත් මුව මකර කටක් මෙන් විවරව ඇත.
ඔහුගේ ගොරෝසු කටහඬ මුල් ගීතයේ තිබු ලයාන්විත භාවය විනාශ කර ඇති සෙයකි.

එය ඇත්ත වශයෙන්ම ඔහු ගැහම තිබු කේන්තිය පිටකරන ආකාරයක් හඟවයි.

ඒ අම්හිරි ශබ්දය ඔහුගේ උඩු රැවුලේ වැදී මුහුණ පුරා ඇති දිගු රැවුල් ගස් අතර රැඳී කෑම කුඩු ඉවත් කරන්නට නම් සමත් විය.
මයිකල් තම රැවුල් ගස් ගොරෝසු ඇඟිලි තුඩු වලින් පිරි මඳිමින් දිගින් දිගටම ගායනය කළේය.

ටික වෙලාවක් යනවිට සින්දුව දිගටම ඇහුනත් එහි ඇති වචන අපැහැදිලි වී ගියේය. එහෙත් මයිකල් තවමත් ගයයි.
තාලය හරියට ශීත කාලයේ උදේ පාන්දර ඇහෙනා හරි/ වෘක හුවක් හා සමානය.

මේ ගොරහැඩි අන්දෝනාව පැවතුනේ ඔහුගේ මත් පෑන් බෝතලය ඉවර වෙන තුරු පමණි. එහෙත් දැන් මැදියම් රෑය පසුවී සෑහෙන වෙලාවකි.

අනතුරුව ඔහු තමා වැඩිවී සිටි බංකුවේම පැත්ත වැටී නිදා ගනියි.

නැතහොත් තම හිස මේසයේ තට්ටුව ටම කිඳා බහින්නට හරියි.

උදේ සංගුව වදින තෙක්ම මයිකල් මෙලෙසම නින්දේ පසුවෙයි. ඔහුගේ සුරතල් බල්ලාද අසලම වකුටු වී සිටියි.

මතු සම්බන්ධයි